---

# කැලණිය ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 15 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කැලණිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි රු.537,622 ක ස්ථාවර තැන්පතු 7 ක වටිනාකම ගිණුම්වලින් අත්හැර තිබුණි.

(ආ) පළාත්සභා විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු ප්‍රාග්ධන ආධාර හා ලැබියයුතු ආදායම් රු.2,973,153 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) හුණුපිටිය ළදරු පාසලේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා දෙන ලද 20% ක අත්තිකාරම් මුදලින් 2012 දෙසැම්බර් 31 දිනට පියවා නොගත් රු.1,048,053 ක මදල පෙර ගෙවුම් යටතේ දක්වා නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.75,626,516 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,946,182 ක්වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,300,837 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාළව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | **දෙසැම්බර් 31** දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 50,167 | 44,501 | 52,449 |
| (ii) | බදුකුලී | 11,022 | 10,814 | 4,070 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,015 | 1,080 | 648 |
| (iv) | වෙනත් ආදායම් | - | - | 693 |

ඉහත කරුණු අනුව හිඟ ආදායම් අයකරගැනීමේ ප්‍රගතිය 49% ක් විය.

### 2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.51,647,455 ක් වූ අතර වසර 1 ක් ඉක්ම වූ හිඟහිටි වරිපනම් බදු ශේෂවල එකතුව රු.30,285,543 ක් විය.

### 2.2.3 වෙනත් ආදායම්

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වෙනත් ආදායම් ශේෂය රු.7,685,708 ක්වූ අතර වසරක් ඉක්මවූ හිඟහිටි ආදායම රු.5,280,206 ක් විය. ඉන් රු.2,919,337 ක් වසර 5 ඉක්මවූ ශේෂයන් විය.

(ආ) කැලණිය බස්නැවතුම් පොළ දෙමහල් වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩ කාමර 10 ක් 2008 වර්ෂයේ සිට 2013 ජූලි 10 විගණිත දිනය වන තෙක් වසා දමා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා භූමියේ ස්ථාපිත උත්සව ශාලාව 2009 මාර්තු 01 දින සිට බදුකරු විසින් අතහැර ගොස් තිබූ අතර, එදින සිට 2013 ජූලි 10 විගණිත දින වන විට වසර 4 ක් ගතවී ඇතත්, නැවත ටෙන්ඩර් කැඳවා බදු දීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**2.2.4 කඩ කාමර බදු**

**----------------**

(අ) කැලණිය බස් නැවතුම්පොළ දෙමහල් වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩ කාමර 24 ක්ද, බිම් මහලේ කඩ කාමර 17 ක්ද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව හෝ 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 178(9)(4) අනුව **හෝ** ටෙන්ඩර් කිරීමකින් තොරව බදු දී තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වසර 03 කට බදු දෙන ලද කිරිබත්ගොඩ බස් නැවතුමේ උතුරු මායිමේ කාණුවට යාබද ඉඩමේ ඉදිකර ඇති කඩ බදුදීම සඳහා වූ බදු ගිවිසුමේ 6 හා 7 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව අනවසරයෙන් කඩ කාමර 28 ක් බදුකරු විසින් ඉදිකර තිබුණි.

එම කඩ කාමර 28 සභාවේ කර්මාන්ත අධිකාරී විසින් රු.8,741,517 කට තක්සේරු කර තිබුණි. බදුකරුගෙන් හිඟව ඇති රු.1,064,860 ක මුදල එයට හිලව් කිරීමට සභාව සම්මත කර තිබුණි. 2010 නොවැම්බර් 01 සිට කඩ කාමර වලින් කුලී අයකර ගතයුතු වුවත්, එසේ අයකර ගෙන නොතිබු අතර, පිළිගත් වෘත්තීය තක්සේරුකරුවෙකුගේ තක්සේරුවක් පදනම් කරගෙන කුලී අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.

2.3 <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

(අ) 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය මහජන පුස්තකාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, පුස්තකාලයේ නොමැති රු.94,277 ක් වටිනා පොත් 1534 ක් පිළිබඳව වාර්තා කර තිබුණි. මේ සම්බන්ධයෙන් විගණන දිනය වූ 2013 ජූලි වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කැලණිය බස්නැවතුම් පොළ දෙමහල් වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට පෙර භූමියේ හිමිකම පිළිබඳව නිරවුල් කර නොගෙන වෙළඳ සංකීර්ණය ඉදිකර තිබුණි. ඒ සඳහා කඩ හිමියන් 30 කගෙන් ලබා ගන්නා ලද එක්වන් මුදල්වල වටිනාකම රු.18,505,785 ක් විය.

2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

2.4.1 **හුණුපිටිය ළදරු පාසල ඉදි කිරීම**

හුණුපිටිය ළදරු පාසල් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.9,981,453 ක මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබූ අතර මෙම ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,409,934 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණන දිනය වූ 2013 ජූලි 23 වන විටත් ව්‍යාපෘතිය නිමකර නොතබූ අතර ඉදිකිරීම් කටයුතු නවතා මාස 15 ක පමණ කාලයක් ගතවී ඇති බවත්, ගොඩනැගිල්ලේ වහලය සෙවිලි නොකර නියමිත ප්‍රමිතියෙන් බැහැරව බිත්ති කපරාරු කර වැස්සෙන් සහ අව්වෙන් ගොඩනැගිල්ලට හානි සිදුවන බව අනාවරණය විය.

(ආ) ඉදිකිරීම සම්බන්ධයෙන් උපදේශන ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය කටයුතු කරන අතර, ඒ වෙනුවෙන් රු.222,768 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණි. ඉදිකිරීම් වල අඩුපාඩු සම්බන්ධයෙන් සභාව විසින් 2013 මාර්තු 19 දින උපදේශන ආයතනය වෙත දැනුම්දී තිබුණද ඒ සම්බන්ධයෙන් අදාළ ආයතනය කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්ය සාධන ඇපකරය 2011 ඔක්තෝබර් 03 දිනෙන් අවසන්ව ඇතත් කාලය දීර්ඝ කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) 2010 ඔක්තෝබර් 05 දින ගෙවන ලද 20% අත්තිකාරම් මුදලින් රු.1,048,053 ක මුදලක් වසර දෙකකටත් වැඩි කාලයක් ගතවී ඇතත් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4.2 **හුණුපිටිය සාප්පු සංකීර්ණය ඉදි කිරීම**

හුණුපිටිය සාප්පු සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතිය 2009 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ටෙන්ඩර් මුදල රු.24,036,582 ක් වූ අතර, 2009 ඔක්තෝබර් සිට 2011 සැප්තැම්බර් දක්වා රු.19,320,324 ක් ඒ වෙනුවෙන් වියදම් දරා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණන දිනය වූ 2013 ජූලි 23 වන විට වසර තුනකටත් වැඩි කාලයක් ගතවී ඇතත් මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් වී නොතිබුණි.

(ආ) ඇප බැඳුම්කර කාලය 2011 දෙසැම්බර් 16 දිනෙන් අවසන් වී ඇති නමුත් කාලය දීර්ඝ කරගෙන නොතිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතියේ තුන්වන බිල්පත සකස් කිරීමේදී මුළු කළවැඩ වටිනාකම වූ රු.10,174,171 න් පළමු හා දෙවන බිල්පත්වල සඳහන් කළ වැඩ වටිනාකම අඩුකර ගණනය කළ යුතු වුවත්, සාවද්‍ය ලෙස දෙවන **බිල්පතේ** සඳහන් කළ වැඩ වටිනාකම පමණක් අඩු කිරීම නිසා රු.4,073,597 ක් වැඩිපුර කොන්ත්‍රාත්කරුවෙත ගෙවා තිබුණි.
මෙසේ වැඩිපුර ගෙවන ලද රු.4,073,597 ක මුදලින් තවදුරටත් අයකරගතයුතු රු.537,293 **ක මුදලක්** වසර දෙකකටත් වැඩි කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට සභාව අපොහොසත්වී තිබුණි.

(ඈ) මෙම ව්‍යාපෘතියේ 20% අත්තිකාරම් ලෙස රු.4,807,317 ක් 2009 ඔක්තෝබර් 14 සිට 2010 ජූනි 17 දින දක්වා වූ කාලය තුළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එම මුදලින් 2013 ජූනි වන විට රු.2,426,486 ක මුදලක් පමණක් අයකර ගෙන තිබුණු අතර, තවදුරටත් පියවා ගතයුතු අත්තිකාරම් මුදල රු.2,380,831 ක් විය.

(ඉ) මෙම ව්‍යාපෘතියේ උපදේශන සේවා ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය කටයුතු කරන ලද අතර, 2012 දෙසැම්බර් 31 දින රු.145,085 ක මුදලක් උපදේශණ ගාස්තු ලෙස ගෙවා තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය මෙසේ වසර ගණනාවක් ප්‍රමාදවීම සහ සභාව මෙතෙක් දරා ඇති විශාල වියදම සඳහා නිසි ප්‍රයෝජනයක් නොලැබීම තුළින් ව්‍යාපෘතිය **සාර්ථක** කර ගැනීමට මෙම උපදේශන සේවාවෙන් වූ දායකත්වය ගැන විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

**2.5** <u>වාහන කුලියට ගැනීම</u>

සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් වාහන 2 ක් කුලියට ගැනීම වෙනුවෙන් රු.867,241 **ක්** කුලී **වශයෙන් ගෙවා** තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු **ලැබේ.**

(අ) කුලී වාහන ලබා ගැනීම සම්බන්ධයෙන් අවම වශයෙන් දිනකට ධාවනය වියයුතු දුර ප්‍රමාණය **ඇතුලත්** විධිමත් ගිවසුමකට එළඹී නොතිබුණි.

(ආ) කුලියට ගත් වාහන ඉන්ධන ලීටරයකට සාමාන්‍ය ධාවනය කිලෝ මීටර්5-7 අතර අඩු අගයක් ගෙන තිබුණු අතර, ඉන්ධන හා කුලී වශයෙන් රු.1,653,725 ක් සමාලෝචිත වර්ෂයේ දී වැය දරා තිබුණි.

2.6 **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

වර්ග කිලෝ මීටර් 20.1 ක වපසරියකින් යුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන කසළ ප්‍රමාණය මෙ.ටො. 30-35 ත් අතර ප්‍රමාණයක් වන අතර, සභාව මගින් මින් කසළ මෙ.ටො. 20-25 ත් අතර ප්‍රමාණයක් එකතු කරනු ලබයි. මෙසේ එකතු කරනු ලබන අපද්‍රව්‍ය වලින් දිරන අපද්‍රව්‍ය මෙ.ටො. 09 ක් පමණ කොම්පෝස්ට් පොහොර බවට පත් කිරීමේ අරමුණ ඇතිව මානෙල්ගම කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව 2012 වර්ෂයේදීද මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.4,627,919 ක මුදලක් වියදම් දරා තිබුණි.

පහත කරුණ නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතු කරන කසළ මෙ.ටො. 20-25 ත් අතර ප්‍රමාණයෙන් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා යොදා ගන්නේ දිරන අපද්‍රව්‍ය මෙ.ටො. 09 ක් පමණකි. ඉතිරි අපද්‍රව්‍ය දිරන/ නොදිරන ලෙස තේරීමක් සිදු නොකර සියළුම අපද්‍රව්‍ය බොරළු පස් දමා වසා දැමීම සිදු කරයි. මේ සඳහා පස් සැපයීමට සහ යන්ත්‍ර මගින් පස් තුනී කිරීමටද සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.10,476,611 ක් වියදම් දරා තිබීම මත කොම්පෝස්ට් ව්‍යාපෘතිය ඉදි කිරීමේ අරමුණ ඉටුවී ඇද්ද යන්න මතභේදයට ලක්විය.

(ආ) එහෙත් කසළ තේරීමක් සිදු නොකර මෙසේ වසා දැමීම තුළින් නොදිරන අපද්‍රව්‍ය දිගින් දිගටම පැවතීම නිසා මෙම ක්‍රමය තුළින් පාරිසරික ගැටළු ඇතිවීමට ඉඩ ඇති බවත්, බෝතල් ප්ලාස්ටික් වැනි නොදිරන අපද්‍රව්‍ය තේරීමක් සිදු කලේනම් ඒවා අලෙවියෙන සභාවට ආදායමක්ද ලබාගැනීමට හැකියාව ඇති බවත් නිරීක්ෂණය කෙරේ.

3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය